අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/21/07/03/2020-III

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.01.04

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**<u>කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ සෞඛ්‍යාරක්ෂිතව පාසල් විවෘත කිරීම</u>**

කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ 2021 වර්ෂය සඳහා 2021.01.11 දින සිට සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයට පාසල් විවෘත කිරීමට තීරණය කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් සහ ප්‍රවාහන සේවා රියදුරන් සඳහා ද උපදෙස් නිකුත් කර ඇති අතර මෙම උපදෙස් පිළිබඳ ඔබ පළාතේ විදුහල්පතිවරුන් දැනුවත් කළ යුතුය.

එයට අමතරව 2020.05.11 දින මා විසින් නිකුත් කර ඇති අංක 15/2020 දරණ කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමට පාසල් හා අධ්‍යාපන ආයතන සූදානම් කිරීම සඳහා චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය ප්‍රකාරව පාසල් නැවත විවෘත කර පවත්වාගෙන යාමට විදුහල්පතිවරුන් විසින් කටයුතු කළ යුතු බව අවධාරණය කරමි. 2021.01.04 දින නිකුත් කළ උපදෙස් පත්‍රිකාව මේ සමඟ අමුණා ඇත.

මේ සම්බන්ධව ඔබ විසින් දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස.
2. සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. දැ.ගැ.ස.
3. සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන් - කරු. දැ.ගැ.ස.